මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/29** **2024.10.18**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

### කායික දුබලතාවෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 83 (4) (ඇ) ඡේදය අනුව, යම් කිසි කායික දුබලතාවයක් නිසා යම් තැනැත්තෙකුට පා ගමනින් හෝ වෙනත් පොදු ප්‍රවාහන සේවාවක් මඟින් ඡන්ද පොළට යාම සහ ඊම කළ නොහැකි නම් ඡන්ද පොළට යාම සහ ඊම සඳහා යම් වාහනයක් මඟින් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා ස්වකීය ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත තමා විසින්ම හෝ එසේ නොමැති නම් තමා වෙනුවෙන් අපේක්ෂකයකු, ස්වාධීන කණ්ඩායම් නායකයකු, බලයලත් නියෝජිතයකු, ප්‍රාදේශීය නියෝජිතයකු නොවන වෙනත් අයකු විසින් හෝ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකිය.

02. මෙම පහසුකම් සඳහා වූ අයදුම්පත්‍ර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් හෝ www.elections.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ඡන්ද විමසීම් දිනයට දින හතකට පෙර, එනම් 2024 නොවැම්බර් 07 වන දින හෝ ඊට පෙර අදාළ තේරීම්භාර නිලධාරී (දිස්ත්‍රික් ලේකම්/ දිසාපති) හෝ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය හෝ සහකාර මැතිවරණ කොමසාරිස් (දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය) වෙත ඉදිරිපත් කළ යුතු වේ.

03. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන තැනැත්තා, තමාට පොදු වාහනයකින් හෝ පයින් ඡන්ද පොළට යාම් ඊම් කිරීමට නොහැකි බව තහවුරු කරමින් ලියාපදිංචි වෛද්‍යවරයකුගෙන් (බටහිර හෝ දේශීය) ලබා ගත් වෛද්‍ය සහතිකයක් මඟින් සිය අයදුම්පත සනාථ කරන්නේ නම් තීරණයක් ගැනීමේ දී එය තේරීම්භාර නිලධාරීට මහත් පහසුවක් වනු ඇත. තමා පරීක්ෂා කර බලා සහතිකයක් නිකුත් කරන ලෙසට එබඳු තැනැත්තෙකු රජයේ වෛද්‍යවරයකුගෙන්, ලියාපදිංචි හෝ සහකාර වෛද්‍ය වෘත්තිකයකුගෙන් හෝ ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් ඉල්ලීමක් කල හැකි ය. පෞද්ගලික වෛද්‍යවරුන්ගෙන් (බටහිර හෝ දේශීය) ලබා ගන්නා සහතිකවල එම වෛද්‍යවරයාගේ නම සහ ලියාපදිංචි කළ අංකය සඳහන් කළ යුතු ය.

04. මැතිවරණ කොමිෂන් සභාව විසින් චලනාබාධිත හා දෘෂ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන වසර 10 ක් වලංගු තාවකාලික හැඳුනුම්පත් හිමි පුද්ගලයන් වෛද්‍ය සහතිකය ලබා ගැනීම අවශ්‍ය නොවේ

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

අයදුම්පත

පාර්ලිමේන්තු මැතිවරණය - 2024

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

83(4) (ඇ) වැනි ඡේදය යටතේ වාහනයක් පාවිච්චි කිරීම පිණිස
ශාරීරික දුබලතාවයෙන් යුතු තැනැත්තෙකු විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍රය

මැතිවරණ කොට්ඨාසයේ භාරකාර නිලධරයා වෙතය

01. කායික දුබලතාවයෙන් යුතු අයගේ විස්තර

අ.සම්පූර්ණ නම :..........................................................................................

ආ.ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................

ඇ.තැපැල් ලිපිනය :..........................................................................................

ඈ. දුරකථන අංකය:..............................................

ඉ. 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාම ලේඛනයේ දැක්වෙන පරිදි ලියාපදිංචි විස්තර

මැතිවරණ කොට්ඨාසය:.............................................. ඡන්ද ප්‍රදේශය:..............................................

ඡන්ද කොට්ඨාස අංකය:.......................................... අනුක්‍රමික අංකය (දන්නේ නම්) :..............................

02. කායික දුබලතාවය පිළිබඳ කෙටි විස්තරයක් : ..........
..........................................................................................................................

03. කායික දුබලතාවයෙන් පෙලෙන්නා වෙනුවෙන් වෙන යම් අයෙකු විසින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් ඔහුගේ /ඇයගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය සහ සබඳතාව : ..........................................
..........................................................................................................................

04. මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කායික දුබලතාව සනාථ කිරීම සඳහා, රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ / ලියාපදිංචි හෝ සහකාර වෛද්‍ය වෘත්තිකයෙකුගේ/ ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ /පෞද්ගලික වෛද්‍යවරයෙකුගේ වාර්තාවක් මේ සමඟ එවමි.(ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ හැඳුනුම්පතක් ඇත්නම් එහි පිටපතක් අමුනන්න)

වෛද්‍යවරයාගේ නම : ..........................................................................................

ලියාපදිංචි කළ අංකය : ..............................................................

05. ඉහත 2 කරුණ යටතේ විස්තර කර ඇති කායික දුබලතාවය නිසා මට / කායික දුබලතාවයෙන් යුත් ඉහත සඳහන් අයට පයින් හෝ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් හෝ ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හෝ යම් කිසි පොදු ප්‍රවාහන සේවයක් මගින් සැපයෙන ප්‍රවාහන පහසුකම් මගින් ඡන්ද පොළට යා නොහැකි බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

06. ඉහත සඳහන් ඡන්ද විමසීමේදී ඡන්දය පාවිච්චි කිරීම සඳහා ඡන්ද පොළ වෙත යාමට හා ඊමට, මට/කායික දුබලතාවයෙන් යුතු ඉහත නම් සඳහන් අයට යම් කිසි වාහනයක් පාවිච්චි කිරීමට ලිඛිත අවසරයක් දෙන මෙන් මෙයින් ඉල්ලා සිටිමි

..............................................

දිනය;............................................ කායික දුබලතාවයෙන් යුතු අයගේ / ඔහු වෙනුවෙන් ඉල්ලුම් කෙරෙන වෙනත් අයෙකුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ